**ආණමඩුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනයකළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සැපයුම් හා උපකරණ වියදම රු. 157,830 ක් ගිණුමට ගලපා නොතිබීමෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, වරෙන්තු ගාස්තු හා දඩ ආදායම තුළ ඇතුළත් කර තිබූ රු.250,000 ක සාවද්‍ය ඇස්තමේන්තුව නිසා එකී ආදායම හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද උසාවි දඩ රු.1,490,265 ක් වර්ෂයේ උසාවි දඩ ආදායම තුළ දක්වා තිබූ අතර, 2015 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා උසාවි දඩ ආදායම තක්සේරු කර ගලපා නොතිබුණි.

(ඇ) පුස්තකාල දඩ රු.670,050 ක් ලෙස දක්වා තිබුණ ද, එහි රු.498,500 ක හිඟ උසාවි දඩ සාවද්‍ය ඇස්තමේන්තුවක් හා තවත් සාවද්‍ය ලෙස මුදලක් ඇතුළත්ව තිබූ අතර, එකී ගිණුමේ පැවතිය යුතු නිවැරදි ශේෂය රු.2,070 ක් විය. ඒ නිසා පුස්තකාල දඩ ආදායම හා වර්ෂයේ අතිරික්තය රු.667,980 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය ලෙස ගිණුමේ රු.390,656 ක් දක්වා තිබුණ ද, අදාල ශේෂ තහවුරු කිරීම්වලට අනුව තවදුරටත් ගෙවිය යුතු ශේෂයක් නොවීම.

(ඉ) ඉකුත් වර්ෂයට අදාල හිඟහිටි වෙනත් ආදායම් හඳුනාගෙන ගිණුම් නොතැබීමෙන් 2014 වර්ෂයේ රු.615,762 ක ආදායම් 2015 වර්ෂයේ දී ලැබෙන විට හිඟහිටි වෙනත් ආදායම් ගිණුමට බැර කිරීම නිසා එකී ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) වෙනත් ආදායම් ලෙස දක්වා ඇති රු.13,709,445 ක් තුළ රු.7,754,081 ක මුද්දර ගාස්තු හා රු.5,682,541 ක කර්මාන්ත ණයගැති ශේෂ අඩංගුව ඇති නිසා එම ගිණුම රු.13,436,622 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමට වර්ෂය තුළ හා ඉකුත් වර්ෂ සඳහා ලද රු.8,728,690 ක මුද්දර ගාස්තු නොගැලපීමෙන් හිඟහිටි මුද්දර ගාස්තු ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ට ගෙවිය යුතු රු.4,464,126 ක ශේෂය තුළ වර්ෂයේදී ගෙවිය යුතු දායකය හා වර්ෂය තුළ කල ගෙවීම් ගලපා නොතිබීමෙන් එම ගිණුමේ ගෙවිය යුතු ශේෂය රු.2,298,032 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) Airtel කුළුණ වෙනුවෙන් 2015 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ලැබිය යුතු රු.38,500 ක ගාස්තු ආදායම් වශයෙන් හා ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි.

(ඒ) 2014 වර්ෂය සඳහා රු.4,387,374 ක් ද, 2015 වර්ෂයට රු.5,333,376 ක් ද, වශයෙන් රු.9,720,750 ක ප්‍රාග්ධන ආධාර සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභාවෙන් ලද පුනරාවර්තන ආදායම් ලෙස ගිණුම් ගතකර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ පසුගිය වසරට අදාල ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.4,387,374 ක් සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ අතිරික්තය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) ගෙවිය යුතු මුද්දර බදු රු.38,545 ක් ජංගම වගකීමක් ලෙස ද , ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.5,682,542 ක් ප්‍රාග්ධන ආදායම් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ දක්වා නොතිබූ අතර, ලැබිය යුතු මුදල් ජංගම වත්කම් ලෙසද දක්වා නොතිබුණි.

(ඕ) වෙනත් ආදායම් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ දක්වා ඇති රු.100,000 ක මුදල අයභාර ආදායමක් නොවන අතර, එය 2014 කර්මාන්ත ණයගැතියන්ගෙන් ලද මුදලකි. මේ නිසා වර්ෂයේ අතිරික්තය රු.100,000 ක් වැඩියෙන් හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) වෙනත් ආදායම් යටතේ දක්වා තිබූ රු.46,678 ක ශේෂය තුළ 2014 වර්ෂයේ කර්මාන්ත ණයගැතියන් සඳහා ලද රු.25,000 ක් ද ඇතුළත් වී තිබුණි.

(ඛ) ජංගම වගකීම් යටතේ වූ රු.2,074,203 ක් තුළ තැන්පත් හා රු.89,967 ක විශ්‍රාම වැටුප් තැන්පත් සම්බන්ධයෙන් ගිණුම්කරණ පදනමක් අනාවරණය කර නොතිබුණි. එම ශේෂය ශේෂ පිරික්සුමේ මුද්දර ශේෂය වශයෙන් බැරට දක්වා තිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු රු.32,385,605 ක් හා ගෙවිය යුතු මුදල් රු.22,956,615 ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවූ ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු.17,131,939 ක් සහ වර්ෂ 03 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ශේෂවල වටිනාකම රු.6,228,277 ක් විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

**-------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 2,826,082 ක් වූ ගිණුම් ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,935,349 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,583,021 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

**වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | |
| පුද්ගල පඩිනඩි | 44,730 | 43,727 | 1,003 |
| අනෙකුත් | 28,253 | 15,504 | 12,749 |
| උප එකතුව | 72,983 | 59,231 | 13,752 |
| ප්‍රාග්ධන වියදම් | 131,820 | 18,398 | 113,422 |
| මුළු එකතුව | 204,803 | 77,629 | 127,174 |

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධන අනුපාතය (ජංගම වත්කම් : ජංගම වගකීම්) 2.3:1 ක් විය. ඊට පෙර වර්ෂයේ දී එය 1.5:1 ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ දී කාරක ප්‍රාග්ධන අනුපාතයෙහි ඉහළ යාමක් විය.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 2,777 | 1,870 | 907 |

| | | | |
|---|---|---|---|
| බදුකුලී, කඩකුලී | 13,126 | 10,731 | 2,395 |
| බලපත්‍ර ගාස්තු | 1,138 | 963 | 175 |

ඉකුත් වර්ෂය හා සසඳා බලන කල සමාලෝචිත වර්ෂයේ දී අයකරගෙන තිබූ වරිපනම් හා බදු ආදායම ඊට පෙර වර්ෂයේ දී අයකර ගෙන තිබූ ආදායම ආසන්නයට හෝ ලඟාවීමට නොහැකිව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් හිඟ ආදායම් හා බිල්කල ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| ආදායම් ශිර්ෂය | **2015.01.01 දිනට හිඟ ආදායම** | හිඟයෙන් අයවීම | හිඟ අයවීමේ ප්‍රගතිය | වර්ෂය තුළ බිල්කල ආදායම | බිල්කල ආදායමින් අයවීම | අයවීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | රු. **'000** | රු. **'000** | % | රු. **'000** | රු. **'000** | % |
| වරිපනම් | 3,145 | 771 | 24 | 1,905 | 963 | 51 |
| කුලී | 230 | 155 | 67 | 945 | 814 | 86 |
| බදු කුලී | 544 | 9 | 2 | 8,098 | 7,157 | 88 |
| අක්කර බදු | 315 | 34 | 11 | 61 | 16 | 26 |

(i) වරිපනම් බදු හිඟ හා බිල්කල ආදායම අයවීම වර්ෂය තුළ මන්දගාමීව සිදුව ඇති අතර, හිඟ ආදායම් බිල්කල ආදායම අයවීමටත් වඩා පහළ මට්ටමක පැවතුණි. මේ නිසා ඉකුත් වර්ෂවල හිඟ මුදලට, වර්ෂයේ හිඟය එකතුවීමෙන් රු.3,317,221 ක වරිපනම් බදු හිඟයක් අයවීමට තිබුණි.

(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති සහ 158 වගන්තිය ප්‍රකාර වරිපනම් බදු හා හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) පසුගිය වර්ෂවල හිඟ කඩකුලී වටිනාකම රු.229,939 ක් ද, වර්ෂයේ බිල්කල ආදායමින් හිඟය රු.130,920 ක් විය. අක්කර බදු හිඟ අයවීම මන්දගාමීව සිදුව තිබුණි.

### 2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2015 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා උසාවි දඩ රු.2,487,120 ක් ලැබී තිබූ අතර, ඉතිරි මාස දෙක සඳහා ලැබිය යුතු උසාවි දඩ ඇස්තමේන්තුකර ගිණුම් ගතකර නොතිබුණි. අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල තුනකින් ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්වලට ඇතුලත් කිරීම වෙනුවට එක් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයකින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා ලද රු.974,559 ක්ද, ඉතිරි කාලය සඳහා රු.2,070,628 ක් ඇස්තමේන්තු කර ගිණුම් ගතකර තිබුණි.

## 3. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.1 විගණන හා කළමනාකරණ කමිටු

වයඹ ප්‍රධාන ලේකම්ගේ 2010 ඔක්තෝබර් 05 දිනැති අංක ව/ප්‍ර/ලේ/05/03 විගණන කමිටු දරන ලිපියට අනුව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කිසිදු රැස්වීම් වාරයක් පවත්වා නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

රු.597,668 ක් වටිනා ට්‍රැක්ටරය වසර 03 ක් සහ වටිනාකම ඇස්තමේන්තු නොකල මිනි කුබෝටා ට්‍රැක්ටරය වසර 05 ක කාලයක් නිශ්කාර්යව පැවතුණි.

**(ආ) මානව සම්පත් කළමනාකරණය**

<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ගණනය කර නොතිබූ අතර, 2013 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගෙන තිබුණි. එහෙත් 2013 වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සංවර්ධන හා අනෙකුත් කාර්යයන් පුළුල්වීමක් සිදුව තිබුණ ද, ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය වෙනස්වීම සිදුකර නොතිබුණි.

(ii) 2013 (අවසන්වරට) පිළියෙල කල අනුමත කාර්යය මණ්ඩලයෙහි සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකු අනුමතව සිටිය ද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ස්ථිර නිලධාරීන් දෙදෙනකු පමණක් සේවයේ යෙදී සිටි අතර, තවත් සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු සභාවට අනුයුක්ත කර තිබුණි.

(iii) 2013 දී ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 11 ක් වෙනුවෙන් සේවකයින් 56 දෙනෙකු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එම ශ්‍රේණියේ තනතුරු 14 ක් වෙනුවෙන් 66 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ප්‍රාථමික තනතුරු 03 ක පුරප්පාඩු 03 පැවති අතර, එම තනතුරුවලට 15 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

**3.3 බේරුම් නොකල සේවක ණය**

2015 දෙසැම්බර් 31 දිනට හිඟ සේවක ණය අත්තිකාරම් රු.4,840,410 ක් වූ අතර, එයින් රු.72,912 ක් වර්ෂ ගණනාවක් තිස්සේ අය නොවී පැවතුණි. එම ණය අයකර ගැනීම සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/08 පොදු (1) දරන ලිපියේ 4:3 ඡේදය අනුව කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) තොග පාලනය